# ශ්‍රී ලංකාවේ නිසි ප්‍රතිලාභ නොලත් හා සරණාගත දරුවන්ගේ ජීවන තත්වය ඉහළ නැංවීම උදෙසා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රායෝගික අධ්‍යයනයක්

සිල්විියා මේර්කල්
ෆ්‍රෙන්ඩ්ස් කින්ඩර්හිල්ෆ් අන්තර්ජාතිකය

## සාරාංශය

ශ්‍රී ලංකාවේ දහසකුත් දරුවන් සිය දෙමාපියන්ගෙන් වෙන් කර ළමා නිවාසවලට සීමා කිරීමට දිළිඳුකම හා එහි අතුරු බලපෑම්වන ගෘහස්ත ප්‍රචණ්ඩත්වය, දික්කසාද හා බීමත්කම හේතු වී තිබේ. හේතුව හා ඵලය අනිවාර්යෙන්ම අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධවන අතර ඒවා අතර අන්‍යොන්‍ය වූ බලපෑමක් වේ.

1994 වර්ෂයේ සිට ෆ්‍රෙන්ඩ්ස් කින්ඩර්හිල්ෆ් අන්තර්ජාතිකය (FKI) ළමා නිවාසවල වෙසෙන දරුවන් මෙන් ම සිය පවුල් සමග හෝ ඥාතීන් සමග වෙසෙන සරණාගත හා අර්ධ සරණාගත දරුවන්ට උපකාර කරමින් සිටියි. මෙම වැඩසටහන අතරතුර ෆ්‍රෙන්ඩ්ස් කින්ඩර්හිල්ෆ් අන්තර්ජාතිකය (FKI) මගින් ළමා නිවාස දෙකක (වාද්දුව තුඩාවේ ගැහැණු ළමා නිවාසය හා හික්කඩුව පතනේ බරණසූරිය පිරිමි ළමා නිවාසය) දරුවන්ගේ පවුල් පසුබිම විශ්ලේෂණය කෙරුණු අතර මේ දරුවන් අතරින් බොහෝ දෙනෙකු දනට ඔවුන්ගේ දෙමාපියන් නැති නිසා නොව හුදෙක් ආර්ථික හේතු නිසා ළමා නිවාසයට ඇතුලු කර ඇති බව අනාවරණය විය.

බොහෝ අවස්ථාවල දී මෙයට සමාන ලෙස දරුවන් ළමා නිවාසවලට ඇතුළත් කිරීමේ ප්‍රධාන හේතු වූයේ ද මේවාමය. දිළිඳුකම නිසා ඇති වන බීමත්කම හා ඒ හා සම්බන්ධවන වෙනත් ගැටලු ශ්‍රී ලංකාව තුළ දැඩි අවධානයට ලක් වී තිබේ. මෙය විශේෂයෙන් ම පවුල් ජීවිතය කෙරෙහි ඉතා අයහපත් බලපෑම් ඇති කරයි. නිසි ආදායම් මාර්ගයක් නොමැති වීම හේතුවෙන් සිය පවුල්වල බරට උර දිය නොහැකි පියවරු එයට විසඳුම් සොයනු වස් බීමත්කමට ඇබ්බැහි වෙති. බීමත් කම හා ප්‍රචණ්ඩත්වය නිසා පවුල් කැඩී යාම සිදුවන අතර මෙහි ප්‍රතිඵලයක් ලෙස දරුවන් ළමා නිවාසවලට ඇතුළු කිරීම සිදු වේ.

දිළිඳුකමින් ගොඩ ඒමේ මාර්ගයක් සේ මව්වරු විදෙස් ගත වීමට විශේෂයෙන් ම මැදපෙරදිග රටවලට යෑමට පෙලඹී සිටිති. අපචාරාත්මක පියවරුන් හෝ වෙනත් කිසියම් ඥාතියකු සරණේ දරුවන් තබා යනු හැර ඔවුන්ට වෙනත් විකල්පයක් නොවේ. මේ දරුවන් කෙටි කලකින් ම පියවරුන්ට හෝ ඥාතීන්ට බරක් වන අතර ඔවුන් ව ළමා නිවාසවලට ඇතුළත් කිරීම සිදු වේ. මේ දරුවෝ සිය මව ආපසු පැමිණෙන තෙක් වසර ගණනාවක් තිස්සේ ළමා නිවාසවල බලා සිටිති. තවත් මව්වරු ශ්‍රී ලංකාවේ ම නිවාසවල වැඩ කිරීමට පෙලඹී සිටින අතර මේ ජීවන පුරුදු නිසා දරුවන්ට මව සමග ජීවත් වීමට හැකියාවක් නොවේ.

බොහොමයක් අවස්ථාවල දී දෙමාපියන්ට තිරසාර ආදායම් මාර්ගයක් සලසා දීමෙන් හා අභ්‍යන්තර පවුල් බේදවාචක විසඳා ගැනීම උදෙසා අතිරේක ආධාර සැපයීම, (උදාහරණ සේ දරුවන්ගේ මූලික අධ්‍යාපන වෙනුවෙන් අවශ්‍ය අවම ආධාර සපයි දීම) මගින් දරුවන් නැවත සිය පවුල් සමග එක් කිරීම සිදු කළ හැකි වේ.

දරුවන් ළමා නිවාසවලට යැවීම වැලක්වීම සඳහා ෆ්‍රෙන්ඩ්ස් කින්ඩර්හිල්ෆ් අන්තර්ජාතිකය (FKI) ශ්‍රී ලංකාවේ බටහිර හා දකුණු පළාත්වල ගම්මාන වල අනුග්‍රාහකත්ව වැඩසටහන් ආරම්භ කර ඇති අතර පසුගිය වසර 5 පුරා දරුණු ආර්ථික ගැටලුවලට මුහුණ පෑ පවුල් සමග සමීපව කටයුතු කිරීම ආරම්භ කර තිබේ. තනි තනි වශයෙන් සිදු කෙරෙන පවුල් උපදේශන සේවා හා තිරසාර ජීවනෝපාය මාර්ගයක් ලබා දීම ඔවුන් යලි දෙපයින් සිටු වීමට හා මත් පැන් හා මත්ද්‍රව්‍ය ඇබ්බැහිය වලක්වා සිය දරුවන්ට අවශ්‍ය ආරක්ෂාව සැපයීමට දෙමාපියන් ශක්තිමත් කරමින් දරුවන් ළමා නිවාසවලට යැවීම වැළැක්වීමට හා හුදෙක් ආර්ථික හේතු නිසා පවුල්වලින් වෙන් වී සිටින දරුවන් නැවත පවුල් සමග එක් කිරීමට ඇති ප්‍රධානතම ක්‍රියාමාර්ගය වේ.